# දේව ප්‍රතිමාව

රංගන ප්‍රසාද්



**මේ අතර සොබහදහම් මතාව ඇගේ ප්‍රාතිහාර්ය පාමින් තිබිනි. රන්වන් ගඟිති කුඩා ගල් වල හැපෙමින් දියකිනිති ඉහිරවමින් සොබාදහමේ සංධ්වනිය ආරම්භ කළේය. නැවතත් මිටියාවත් හරිත පැහැය වැලඳගනිමින් තිබිනි. තුරුලතාවෝ කොල පැහැයට හැරී මල් පොහොට්ටු විසිරී ගත්හ. අනලස් ධවල පුලූන් කැටිති වන් වලා අහස කුස පාවුනි.**

ග්‍රීෂ්ම සෘතුවේ අවසාන පත්‍ර කිහිපයත් පඬු පැහැයෙන් වියලී ඉරුණු පොළව ට පතිත වී නොපෙනී ගියේ ය. කහ පැහැයෙන් දිලිසුනු වනපෙත් අඳුරු අළු පැහැයකින් පාට විය. ක්ෂිතිජය තෙක් කොල පැහැය තැවරූ හරිත මිටියාවත් උණුවී වැටුනු හිරු කිරණින් දැවී පරඬැල් ව ගියේ ය. වසන්තයේ මිටියාවත් වල ඇසුනු ප්‍රීතිමත් ගොපලු වස්දඬු රාව හිමාලයේ සිට පැමිනි වියලි සුලගේ ඒකතානමය හූ.. හඬින් පිරැව්ණි.

වැසි රහිත දින සති වලටත් සති මාස වලටත් ගෙවෙමින් ආගන්තුක ඉඩෝරය නික්ම නොයන ලෙසක් දක්වාලීය. සියලූම දෑස් පැහැදිලි නීල ගගනතලය වෙත නිරන්තර ව යොමුවිනි. අයාලේ ගිය වලාවෝ ඉඳහිට ක්ෂිතිජයෙන් මෙපිටට විත් බලපොරොත්තු කඩකරමින් සැනෙකින් යලිත් නොපෙනී ගියේය.

ශ්‍රාවස්ති පුරය අරුණු වන් සිහින් දූවිලි වලින් යුතු දුමාරයෙන් වැසී තිබිනි. අධික දාහයෙන් යුතු වූ බැවින් වීථි සංචාරය අඩුකොට දහවල් පින්ඩපාතයෙන් පසු ඡේතවන විහාරයේ වැඩ විසීමට බුදුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේ ට අවසර දුන්හ. සැන්දෑ ව දාහය අඩුකලෙන් ශ්‍රාවස්තිය පුරා විසූ උපාසක උපාසිකවන්, කවීන්, සත්‍ය ගවේෂීන්,රාජ්‍යයේ නිලධාරීන් ආදී මෙකී නොකී බොහොමයක් සවන්දීමට, සංවාදයට හෝ කරුණු විමසාදැන ගැනීමට ඡේතවන විහාරයට ඇදුනහ. තරු කැට විසිරී ගිය වියලි රාත්‍රීන් මනරම් සංවාදයන් ගෙන් හා දේශනා වන් ගෙන් අරුත් ගැන්වුනි.

එක් උදෑසනක, අසාමාන්‍ය ලෙස උස කෙසඟ අඳුරු රුවක් ශ්‍රාවස්ති පුරයට ඇතුල් වෙනු සියල්ල වසා පැතිරුනු අරුණු වන් දූවිලි දුමාරය අතරින් පෙනිනි. මේ නම් අමනුෂ්‍යයෙක් යැයි නගර වැසියන් තැති ගත් හ.

දූලි සුළඟ තුනී වී ගිය විට නිවැරදිවම ඒ රුව හඳුනා ගන්නට හැකිවුනි. ඒ වූකලි තරමක් උස දේව ප්‍රතිමාවක් කරතබා ගත් කෙසඟ තරුණයෙකි.

ඔහු උදෑසනින් ම ජේතවන විහරය ඉදිරියෙන් ගමන් කරන යුරු දැකිය හැකිවිය. නැවත දහවලේ විඩාබර දෑසකින් යුතුව විහාරය පසුකරමින් උදෑසන ඔහු පැමිණි දිසාවට ප්‍රතිවිරුද්ධ දිසාව බලා ගමන් කරනු දැකිය හැකි විය. සෙමින් උදාවූ සවස් කාලයේ අධික වෙහෙසෙන් යුතුව ගාටමින් නැවත ත් විහාරය ඉදිරියෙන් යන කල්හි, වාරු නැතිව ගියෙන් විහාරය ඉදිරියෙන් වූ දැවැන්ත වෘක්ෂය ඉදිරිපිට ඇදවැටිනි.

මෙය දුටු භික්ෂූන් වහන්සේ ඔහුව ඔසවාගෙන විහාරය තුලට ගෙන ගොස් ඇප උපස්ථාන කර ප්‍රකෘති තත්වයට පත් කර බුදුන් වහන්සේ හමුවට පැමිණවූහ.

"දරුව නුඹ කුමක් උදෙසා මේ දුක අනුභව කෙරේ ද?" යි බුදුන් වහන්සේ ඇසූහ.

"ස්වාමීනී, මේ දේව ප්‍රතිමාව නිසා වෙමියි" , තරුන මානවකයා පිළිතුරු දිනි.

"ස්වාමීනී, මේ මහා පුරයේ සිට දින තුනක ගමනකින් ලඟා වියහැකි බ්‍රහ්ම පුර නැමති කුඩා ගම්මානයේ සිට පැමිණියෙමි, පියා ගේ ඇවෑමෙන් ගමේ දේවාලයේ භාරකාරිත්වය මට පැවරිනි. අධික ඉඩෝරය පහවී වැසි ලබා දෙන ලෙස කොතෙකුත් යාග හෝම කලත් දෙවියන් වැස්ස ලබා නොදුන් නිසා ගම් වැසියන් උරණ වී පසුදා දෙවොල සමග දෙවියන් ගිනිබත් කිරීමට සැරසුණු බැවින් මම ඊට පෙරදා රාත්‍රියේ ම දේව ප්‍රතිමාවත් රැගෙන ගමින් පලා ආවෙමි"

තව දුරටත් මානවකයා පැහැදිලි කලේය

"ඉදින් මේ පුරයේ තොපට නවාතැනක් සොයගත නොහැකි විණිද?" බුදුන් වහන්සේ විචාළහ.

"එසේය ස්වාමීනී. මේ පුරයේ සියල්ලෝ ම ඔබ වහන්සේ සරණ ගිය වුන් ය. මා රඳවා ගැනීමට කැමති වුවත් මේ ප්‍රතිමාව තබා ගැනීමට කිසිවෙක් නොකැමතියහ. එබැවින් නැවතත් මහ මගට බටුයෙමි"

"ඉදින් දරුව තොපට රුචි නම් මේ ප්‍රතිමාව මෙහි තබා ගොස් නවාතැනක් සොයන්න" මහා කාරුණිකයන් වහන්සේ පැවසූහ.

කමටහන් උගෙනිමින් වුන් තරුණ භික්ෂූන් වහන්සේ මුහුණින් මුහුණ බලා ගත්හ.

අතිශයෙන් විශ්මිතව අමන්දානන්දයට පත් තරුණ මානවකයා බොඳවූ දෙනෙතින් අහස දෙසට නෙත් යොමු කලේ ය. ඈත අහසේ පාත්තයන් රංචු බටහිර ට පියසර කරමින් තිබිනි.

ඉඩෝරය තව දුරටත් දැඩි විය. අවට ගම් දනව් වියලී ගියේ ය. පරිවාර ගම් දනව් වලින් ශ්‍රාවස්ති පුරය ට සැපයුනු භව භෝග ආදියත් අඩුවී ගියේ ය.

මේ අතර ජේතවන විහාරයේ දේව රූපයක් ඇතැයි දස දෙස පැතිර ගියේ ය. සමහරු විශ්මිතවත්, සමහරු කම්පිතවත්, තවත් අය උපහාසාත්මකවත් වත් එදෙස බැලූහ.

තරුණ මානවකයා හිමිදිරියේ ම විහාරයට විත් දේව ප්‍රතිමාවට පුද පූජා පවත්වන්නේ ය. නැවතත් සැන්දෑ යාමයේ පැමිණ එයම කරන්නේ ය. සැන්දෑවට පැමිනෙන ඔහුට සැදැහැවතුන් බුදුන් වහන්සේ හා කරන සංවාද සහ දෙසුම් ශ්‍රවණය වුණි. මෙසේ මඳ කලක් ගත වූ තැන එම සංවාද ඇසීමට රිසි වූ නිසා ම ඔහු වැඩි කාලයක් ගෙන දේව ප්‍රතිමාවට පුද පූජා පවත්වන්නට වීය.

මෙලෙසින් දවස් ගත විය. "ඇයි මේ දේව රූපයක් තියාගෙන ඉන්නෙ?" යි නොමනාපයෙන් තරුණ භික්ෂූන් වහන්සේලගෙන් ඇසීමට තරම් සමහරක් සැදැහැවතුන් ගේ ඉවසීමේ සීමාව ඉක්ම ගොස් තිබිනි. තවත් සමහරක් සැදැහැවතුන් විහාරයට පැමිණීම අඩුවීය.

එක් උදෑසනක ඈත හිමාලය පෙදෙසේ සිට කිලිටි කපු පුලූන් කැදලි ලෙසින් වලාවෝ අහස් කුස රොක් වීමට පටන් ගත්තේ ය. වේලාසනින් ම ක්ෂිතිජය විසින් හාත්පසම ගිලගනිමින් පැවතිනි. සවස් යමයේ බිඳුනු වලාවන් රිදී වන් බිඳු ලෙසින් බිම අදහැලීමට ගත් හ. ඉන්පසු එය මහා වර්ශාවක් ලෙසින් දින තුනක් පුරාවට වැටිනි.

තෙවන දින අවසානයේ උදෑසන බැලූ විට දේව රූපය අතුරුදහන් වී තිබිනි. තරුණ භික්ෂූන් වහන්සේ පුදුමයට පත් වූහ. දෙවියන් වැස්ස ලබාදී අතුරුදහන් විනිද?. නමුත් තරුණ මානවකයාද උදෑසන නොපැමිනියේ ය. ඔහුත් අතුරුදහන් ව තිබිනි. මෙය සැලවීමෙන් පසු සමහරක් භික්ෂූන් වහන්සේ සැනසුම් සුසුම් හෙලූහ.

ජේතවන විහාරයේ හාස්කම් සහිත දේව ප්‍රතිමාවක් තිබූ බවත් එය වැස්ස ලබාදී අතුරුදහන් වී ඇති බවටත් කටකතා පැතිරිනි.

මේ අතර සොබහදහම් මතාව ඇගේ ප්‍රාතිහාර්ය පාමින් තිබිනි. රන්වන් ගඟිති කුඩා ගල් වල හැපෙමින් දියකිනිති ඉහිරවමින් සොබාදහමේ සංධ්වනිය ආරම්භ කළේය. නැවතත් මිටියාවත් හරිත පැහැය වැලඳගනිමින් තිබිනි. තුරුලතාවෝ කොල පැහැයට හැරී මල් පොහොට්ටු විසිරී ගත්හ. අනලස් ධවල පුලූන් කැටිති වන් වලා අහස කුස පාවිනි.

මෙලෙසින් දින කිහිපයක් ගතවූ තැන්හි එක් උදෑසනක ඡේතවන විහාරය ඉදිරිපස වූ ආශ්චර්යය දැක පුර වැසියෝ විශ්මයෙන් ගල් ගැසුනහ. වස්සානයේ පලමු වැස්සෙන් පිපුනු දස දහස් ගනනක්, නේක වර්නයෙන් යුතු පුෂ්ප ජේතවන විහාරය ඉදිරියේ බිම අතුරා තිබිනි.

හිමිදිරියේ සිටම විහාරය ඉදිරිපස මලින් සැරසීම නිසා මඳක් වෙහෙසින් යුතුව එහෙත් ප්‍රීතියෙන් තරුන මානවක තෙමේ එහි සිටියේය. ඔහු දේව ප්‍රතිමාව නැවත ගමට ගෙන ගොස් එය වෙළෙන්දෙකුට විකුනා තිබිනි. එයින් ලද මුදල් වැයකොට එක් මාලා කාරයෙකුගෙන් ඔහු සතුව තිබූ ඉතා අනර්ඝතම, වස්සානයේ පළමු වැස්සට පිපුණු පුෂ්ප ගෙනවිත් මෙහි බිම අතුරා තිබිනි.

"දරුව මේ කුමක් උදෙසාද?" එහි වැඩම කල මහා කාරුණිකයානන් වහන්සේ ඇසූ හ.

"ස්වාමීනී ඔබ වහන්සේ ගේ මහා කරුනික බවෙහිත්, මහා ප්‍රඥාවේත් අංශුමාත්‍රයක් පිදීම උදෙසා" යැයි තරුන මානවකයා පිළිතුරු දිනි

facebook.com/rangana.prasad?fref=nf